සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

අවසාන වාර පරීක්ෂණය - 2025
இறுதி தவணைப் பரீட்சை - 2025 / Year End Term Test - 2025

ශ්‍රේණිය தரம் Grade	10	ජලජ ජීව සම්පත් තාක්ෂණවේදය - I, II	කාලය நேரம் Time	පැය 03යි

නම பெயர் Name ..... විභාග අංකය சுட்டிலக்கம் Index No. .....

අතිරේක කියවීම් කාලය : මිනිත්තු 10

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

- **සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**
- **අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා ගන්න.**
- **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුල (×) ලකුණ යොදන්න.**

1. ජලජ ජීව සම්පත් අපනයනය කිරීම තුළින් ශ්‍රී ලංකාව වැඩිම ආදායමක් ලබාගන්නේ,
   1. විසිතුරු මසුන් අපනයනය තුළිනි.
   2. ජලජ පැළැටි අපනයනය තුළිනි.
   3. ටුනා මසුන් අපනයනය තුළිනි.
   4. පොකිරිස්සන් අපනයනය තුළිනි.

2. වෙරළේ සිට මුහුද දෙසට කිලෝ මීටර 40-100 අතර පවතින මුහුදු කලාපය ලෙස හඳුන්වනුයේ,
   1. අක්වෙරළ කලාපයි.
   2. ගැඹුරු මුහුදු යි.
   3. වෙරළාසන්න මුහුදු යි.
   4. මහාද්වීපික තටාකය යි.

3. ශ්‍රී ලංකාව තුළ බහුල වශයෙන් ජලජීවී වගාව සඳහා යොදාගන්නා මත්ස්‍ය විශේෂයක් වන්නේ,
   1. කාවයියා ය.
   2. මොදා ය.
   3. තිලාපියා ය.
   4. වේක්කයා ය.

4. මෝසම් වැසි හේතුවෙන් පෝෂ්‍ය පදාර්ථයෙන් පිරි විශාල ජල ප්‍රමාණයක් ගංගා හරහා මුහුදට එක් වීමෙන්,
   1. වෙරළාසන්න මුහුදේ පෝෂණය ඉහළ යයි.
   2. ජලජීවී ප්‍රජාවේ වර්ධනය හීනවී යයි.
   3. ලවණතාවය වැඩි වී උෂ්ණත්වය වැඩි වේ.
   4. ජලජ ශාකවල මෙන්ම ජීවීන්ගේ ව්‍යාප්තිය පිරිහෙයි.

5. මත්ස්‍යයෙකුට ජලය තුළ, එක් ස්ථානයක රැඳී සිටීමට උපකාරී වන වරල වනුයේ,
   1. පෘෂ්ඨීය වරල වේ.
   2. වලිග වරල වේ.
   3. ගුද වරල වේ.
   4. ළය වරල වේ.

6. මත්ස්‍යයාගේ ශරීරයට ආරක්ෂාව සපයන විවිධ කොරපොතු පිළිබඳව වගුවක් පහත දැක්වේ. නිවැරදි පිළිතුර දැක්වෙන පේළිය තෝරන්න.

	මත්ස්‍යයන්	කොරපොතු හැඩය
1	මෝරා	ශල්කමය
2	තිලාපියා	දන්තාකාර
3	සූඩයා	කෘකතාභ
4	හබරලියා	වලයාකාර

ශ්‍රී ලංකාව තුළ දක්නට ලැබෙන ජලජ පරිසර පද්ධති කීපයක් පහතින් දැක්වේ. ඒ ඇසුරින් 07 හා 08 ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

A. හදපාන B. හම්බන්තොට C. කලමැටිය D. කෝකිලායි කලපුව

7. විල්ලු ආශ්‍රිත පරිසර පද්ධතියක් පිහිටා ඇත්තේ,
   1. A ය.
   2. B ය.
   3. C ය.
   4. D ය.

Past Papers Wiki

8. මුහුදු තෘණ ආශ්‍රිත පරිසර පද්ධතියක් දක්නට ලැබෙනුයේ,
1. A හා D ය. 2. B ය. 3. C ය. 4. D ය.

9. කුඩා ප්‍රමාණයේ විසිතුරු මත්ස්‍ය ටැංකියක සිටින මත්ස්‍යයන්ට රෝග හටගැනීම වළක්වා ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ගයක් වන්නේ,
1. ආහාර සලාකය වැඩි කිරීම යි.
2. ජලයෙහි භාෂ්මිකතාව වැඩි කිරීම යි.
3. වායු කලඹන මගින් ටැංකිය වාතනය කිරීම යි.
4. ඉඩ ප්‍රමාණයට සරිලන මත්ස්‍ය ගහනයක් පවත්වා ගැනීම යි.

10. පහත රූපයෙන් දැක්වෙන්නේ,




1. කොටු තුල මත්ස්‍ය වගාවකි.
2. කූඩු තුල මත්ස්‍ය වගාවකි.
3. පොකුණක් තුල මත්ස්‍ය වගාවකි.
4. කුඹුරක් තුල මත්ස්‍ය වගාවකි.

11. විසිතුරු මත්ස්‍යයන්ගේ සුදු පුලුන් රෝගයට ප්‍රධාන වශයෙන් හේතු වන්නේ,
1. බැක්ටීරියා ආසාදනයක් වේ. 2. දිලීර ආසාදනයක් වේ.
3. ප්‍රවේණික සාධකයක් වේ. 4. පෝෂණ ඌනතාවක් වේ.

12. ශිෂ්‍යයෙක් විසින් ජලජ ශාක වගාවක් නිරීක්ෂණය කිරීමෙන් පහත ලක්ෂණ හඳුනාගන්නා ලදී.
A- නිමග්න ශාකයකි. B - අර්ධ නිමග්න ශාකයකි. C - උභයජීවී ශාකයකි.
ඉහත ලක්ෂණ අනුව මෙම ශාක පිළිවෙලින් විය හැක්කේ,
1. ග්‍රැසිලේරියා, කොහිල හා උල්වා වේ. 2. කෙකටිය, ග්‍රැසිලේරියා හා කොහිල වේ.
3. ග්‍රැසිලේරියා, ඕලු හා කොහිල වේ. 4. කොහිල, ඕලු හා කෙකටිය වේ.

13. කරමල් පිධානයට ඇතුලතින් විශේෂ ශ්වසන අවයව පිහිටීම නිසා, වායුගෝලීය ඔක්සිජන් ලබාගනිමින් ශ්වසනය කල හැකි මත්ස්‍යයෙකි.
1. ආඳා 2. ලූලා 3. තිලාපියා 4. කාවයියා


14. පහත රූප අතුරින් පැටවුන් බිහිකරන විසිතුරු මත්ස්‍ය විශේෂය තෝරන්න
1. 
2. 
3. 
4. 

- ජලජ පරිසර වල ජෛව විවිධත්වය කෙරෙහි බලපාන ප්‍රධාන සාධක කිහිපයක් පහත දැක්වේ.
A. ලවණතාවය B. ආවිලතාවය C. උෂ්ණත්වය D. pH අගය

15. ඉහත සඳහන් සාධක අතුරෙන් ජලජ පරිසර වල ජෛව විවිධත්වය කෙරෙහි බලපාන රසායනික සාධක වනුයේ,
1. A හා C පමණි. 2. B හා D පමණි. 3. A හා D පමණි. 4. A,B හා D පමණි.

16. පරිණත වූ පසු ප්‍රජනනය සඳහා මුහුදට සංක්‍රමණය වන, ආහාරයට අමතරව ඇමක් ලෙස යොදාගත හැකි මත්ස්‍යයෙක් වනුයේ,
1. මොදා වේ. 2. ආඳා වේ. 3. වෙක්කයා වේ. 4. සූඩයා වේ.

17. පහත රූපයෙන් දැක්වෙන ජලජ ජීවියාගේ ලක්ෂණයක් නොවන්නේ,



1. වැහැරී ගිය සුවිශාල පණුවෙකු වැනිය.
2. දේහය වටා සැකිල්ලක් වැනිය.
3. සංචරණ අවයව පිහිටා නැත.
4. නිතල වාසී ජීවියෙකි.

18. පහත වගන්ති අතුරින් වැරදි වගන්තිය සහිත පිළිතුර තෝරන්න.
1. කොරල් බුහුබාවට මුඛය හා ගුදය ලෙස ඇත්තේ එක් විවරයකි.
2. පසැගිල්ලා ලිංගිකව මෙන්ම අලිංගිකව ද තම වර්ගයා බෝකරයි.
3. දැල්ලාට විලෝපිකයින්ගෙන් ආරක්ෂා වීම සඳහා තීන්ත මඩියක් පිහිටා ඇත.
4. ඉස්සා කිවුල්දිය පරිසරවල පමණක් ජීවත් වේ.

ලක්ෂණය	ප්‍රශස්ත මට්ටම
උෂ්ණත්වය	23-32 ^{O}C
ලවණතාව	15-30 ppt
ද්‍රාව්‍ය ඔක්සිජන්	4 ppm
pH අගය	8 - 8.5

19. ඉහත වගුවෙන් දැක්වෙන්නේ,
1. ඉස්සන් වගාව සඳහා ජලයේ තිබිය යුතු ප්‍රශස්ත පරාසය යි.
2. කකුළුවන් තර කිරීම සඳහා ජලයේ තිබිය යුතු ගුණාත්මය යි.
3. මොදා වගාව සඳහා ජලයේ තිබිය යුතු තත්ත්වයකි.
4. ග්‍රැසිලේරියා වගාවක් සඳහා ජලයේ තිබිය යුතු තත්ත්වයකි.

20. ලොව හමුවන පරිසර පද්ධති අතර විශාල ජෛව නිෂ්පාදනයක්, ජෛව විවිධත්වයක් සහිත ජලජ පරිසර පද්ධතියකි,
1. ලවණ වගුරු ආශ්‍රිත පරිසර පද්ධතිය.
2. මුහුදු තෘණ ආශ්‍රිත පරිසර පද්ධතිය
3. කඩොලාන පරිසර පද්ධතිය
4. කොරල් පර ආශ්‍රිත පරිසර පද්ධතිය

21. පහත සඳහන් ගංගා අතුරින් ගංගාව මුහුදට වැටෙන ස්ථානය (ගංමෝය) පුනීල හැඩයක් ගන්නා ගංගාව වන්නේ,
1. කැලණි ගග යි.
2. දඩුවම් ඔයයි.
3. ගිං ගග යි.
4. නිල්වලා ගග යි.

22. මුහුදු සමග පුළුල් විවරයකින් සම්බන්ධ වූ, ගොඩබිමින් වටවූ, මුහුදු ජලය නිදහසේ ඒ තුලට ගමන් කරන ජල ප්‍රභවයකි.
1. දූපත
2. බොක්ක
3. ගංමෝය
4. තුඩුව

23. ශ්‍රී ලංකාවේ අභ්‍යන්තර ජලාශවල දැකිය හැකි දේශීය මත්ස්‍යයෙක් වනුයේ,
1. බුලත් හපයා ය.
2. මල් පුළුට්ටා ය.
3. කලපු හදයා ය.
4. තිලාපියා ය.

24. නාරා (NARA) ආයතනය සම්බන්ධයෙන් වඩාත් නිවැරදි පිළිතුර තෝරන්න.
1. පරිසර පද්ධති සංරක්ෂණයට නීති පනවන ආයතනය කි.
2. දැනුම තාක්ෂණය සමග පර්යේෂණ සිදුකරන ආයතනය කි.
3. උසස් අධ්‍යාපනය ලබාදෙන ආයතනය කි.
4. යාත්‍රා ආම්පන්න නිෂ්පාදන ආයතනය කි.





25. නළ ජලය මත්ස්‍ය ටැංකියකට එක් කිරීමට පෙර පැය කිහිපයක් ගබඩා කර තබනු ලැබේ. එයට ප්‍රධාන හේතුව,
1. ජලයේ ක්ලෝරීන් ඉවත් කිරීම යි.
2. ක්ෂුද්‍ර ජීවීන් ඉවත් කිරීම යි.
3. අවසාදිත ද්‍රව්‍ය ඉවත් කිරීම යි.
4. විෂ රසායන ද්‍රව්‍ය ඉවත් කිරීම යි.

26. මත්ස්‍ය ආහාර සලාකයක ප්‍රෝටීන් අවශ්‍යතාවය සපුරා ගැනීම සඳහා එක් කල හැකි ද්‍රව්‍යයකි.
1. තිරිගු පිටි
2. ඉස්සන් ඔළු
3. මඤ්ඤාක්කා පිටි
4. හාල් නිවුඩු


27. විසිතුරු ජලජ පැළෑටි වලින් සිදුවන ප්‍රධාන කාර්යය වන්නේ,
1. ගෙවතු අලංකරණය සඳහා භාවිතා කිරීමයි.
2. ජලජ ජීවීන්ට සෙවන සැපයීමයි.
3. ජලජ ජීවීන්ට අවශ්‍ය වාතය හා ආහාර සැපයීමයි.
4. ජලයේ ගුණාත්මය වැඩිකිරීමයි.

28. කඩොලාන ශාක සතු පොදු ලක්ෂණයක් නොවන්නේ මීන් කුමක් ද?
1. පතනශීලි ස්වභාවය
2. දණහිස්මුල් වායුධර මුල් තිබීම.
3. මාංසලමය පත්‍ර දැරීම
4. පත්‍ර විශාල වීම.

29. බලයාගේ පෞඪජ වරලේ හැඩය නිරූපණය වන රූපය මීන් කුමක් ද?

1. 
2. 
3. 
4. 

30. රූපයේ දැක්වෙන මත්ස්‍යයාගේ "A" ලෙස නම්කර ඇති උපාංග අවශ්‍ය වන්නේ,
1. ආහාර ජීර්ණයට ය.
2. පහසුවෙන් පීනා යාමට ය.
3. ශ්වසනය කිරීමට ය.
4. රසායනික ප්‍රතිග්‍රාහක හඳුනා ගැනීමට ය.




31. මත්ස්‍යයෙකුට පිහිටන අනාකූල හැඩය උපකාරී වන්නේ,
1. පටුස්ථාන හරහා පිහිනා යාමට ය.
2. වේගයෙන් පිහිනා යාමට ය.
3. ස්ථායීතාවය පවත්වා ගැනීමට ය.
4. ගල් කොරල් අතර පිහිනීමයට ය.

32. ශ්‍රී ලංකාව, විසිතුරු මත්ස්‍යයන් අපනයනය කරන ප්‍රධාන රටක් වනුයේ,
1. ඉන්දියාව යි
2. රුසියාව යි.
3. දකුණු කොරියාව යි.
4. ඇමරිකාව යි.

33. මත්ස්‍ය පොකුණක, ආවිලතාව මැනීමේ දී එහි අගය 12(mg/l) ලෙස සටහන් වී ඇත. ඒ අනුව ගත හැකි ක්‍රියාමාර්ගයක් වනුයේ,
1. අවසාදිත ජලය භාවිතය යි.
2. ජලය තුල ලවණ ඉවත් කිරීම යි.
3. වාතනය කිරීම යි.
4. අළුහුණු යෙදීම යි.

34. මත්ස්‍යයෙකුගේ අස්ථි පංජරයේ ස්වභාවය පිළිබඳ ශිෂ්‍යයෙකු විසින් කරන ලද ප්‍රකාශනයන් කීපයක් පහත දැක්වේ.
A – කරමල් පිධානයකින් වැසී ඇත.
B – පෘෂ්ඨ වරල අසමානව බෙදී ඇත.
C – බොහෝ විට ශරීර හැඩය දිගටි ස්වරූපයක් ගනී.
ඉහත ප්‍රකාශ අතරින් අස්ථික මත්ස්‍යයෙක් සම්බන්ධයෙන් නිවැරදි වන්නේ,
1. A හා B පමණි.
2. A හා C පමණි.
3. B හා C පමණි.
4. A, B, C යන සියල්ලම වේ.

35. පහත රූප සටහන අනුව ආහාරදාමයක, ජීවයේ පැවැත්මට වැඩිම දායකත්වයක් දක්වන පෝෂණ මට්ටම වනුයේ,



1. A ය.
2. B ය.
3. C ය.
4. D ය.

36. උකුත්පායනය හේතුවෙන් සාගර ජලයේ,
1. ගැඹුරු දියෙහි උෂ්ණත්වය අඩුවේ.
2. ගැඹුරු දියෙහි උෂ්ණත්වය වැඩිවේ.
3. ලවණතාව ඉහළ යයි.
4. ද්‍රාවිත ඔක්සිජන් සාන්ද්‍රණය පහළ යයි.

37. විසිතුරු මත්ස්‍යයන්ගේ අභිජනන රටාව පිළිබඳ වඩාත් නිවැරදි වගන්තිය තෝරන්න.
1. ඒන්ජල් බිත්තර විසුරවන්නෙකි.
2. ප්ලේටි බිත්තර තැන්පත් කරන්නෙකි.
3. ෆයිටර් පැටවුන් බිහිකරන්නෙකි.
4. ගුරාමි පෙණකුඩු සාදන්නෙකි.

38. ඖෂධීය ගුණයෙන් යුතු ආහාරමය ජලජ පැළෑටිය මින් කුමක් ද?
1. කැරකොකු
2. බැකොපා
3. ඇරෝහෙඩ්
4. වෙල් අල

39. ශ්‍රී ලංකාවට වැඩිපුරම හාල්මැස්සන් ආනයනය කරනුයේ,
1. මාලදිවයිනයෙනි.
2. බංගලාදේශයෙනි.
3. ඉන්දුනීසියාවෙනි.
4. පාකිස්තානයෙනි.

40. ශ්‍රී ලංකාව සංචාරක ව්‍යාපාරයේ ප්‍රවර්ධනය සඳහා ජලජ ජීව සම්පත් ආශ්‍රිතව හඳුන්වා දී ඇති නව ප්‍රවණතාවක් වනුයේ,
1. ගාල්ලේ රූමස්සල වෙරළ තීරය නැරඹීමය.
2. මිරිස්ස ඩොල්ෆින් හා තල්මසුන් නැරඹීමට යාමයි.
3. යාපන අර්ධද්වීපය ආශ්‍රිත දූපත් නැරඹීමට යාමයි
4. කල්පිටිය සමුද්‍ර අභයභූමි නැරඹීමට යාමයි.

Past Papers Wiki

II පත්‍රය

පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

1) A. ජලජ ජීව සම්පත් කර්මාන්තය ශ්‍රී ලංකාවේ ආර්ථිකයට ඉමහත් දායකත්වයක් සපයයි.

I. ශ්‍රී ලංකාවේ තුළ කිවුල්දිය ආශ්‍රිත ජලජ පරිසර පද්ධති දෙකක් නම් කරන්න.
II. ජලජ ජීව සම්පත් ආශ්‍රිත,
   a) කර්මාන්තයක් හා
   b) සේවාවක් සඳහන් කරන්න.
III. ශ්‍රී ලංකාවේ ජලජ ජීව සම්පත් ආශ්‍රිත නව ප්‍රවනතා දෙකක් සඳහන් කරන්න.
IV. ජලජ ජීවී සම්පත් කර්මාන්තයේ දී ආර්ථිකමය වැදගත්කමක් දක්වන මත්ස්‍යය නොවන ජලජ ජීවීන් හතරක් නම් කරන්න.
V. ජලජ ජීවී සම්පත් කර්මාන්තය තුළින් දේශීය ආර්ථිකයට දක්වන දායකත්වය කරුණු දෙකකින් දක්වන්න.
VI. මෙම කර්මාන්තයේදී දක්නට ලැබෙන සෘජු රැකියා අවස්ථාවක් හා වක්‍ර රැකියා අවස්ථාවක් නම් කරන්න.

B.

I. මත්ස්‍යයෙකුගේ (විච්ඡේදනය කළ) ආහාර මාර්ග පද්ධතියේ රූපසටහනක් ඇඳ නම් කරන්න.
II. ශාක භක්ෂක හා මාංශ භක්ෂක මත්ස්‍යයන්ගේ ආහාර ජීර්ණ පද්ධතියේ වෙනස්කම් දෙකක් පැහැදිලි කරන්න.
III. මත්ස්‍යයෙකුගේ වාතාශ්‍රයේ පිහිටීම තුලින් ඇතිවන ප්‍රයෝජනය පැහැදිලි කරන්න.
IV. මාංශ භක්ෂක මත්ස්‍යයෙකුට ලබාදිය හැකි ආහාර වර්ග දෙකක් සඳහන් කරන්න.

2) ජලජීවී වගාවක් පවත්වාගෙන යාමේදී ඉහළ මත්ස්‍යය අස්වැන්නක් සඳහා ජලයේ ගුණාංග ප්‍රශස්ත මට්ටමින් පවත්වාගත යුතුය.

I. මත්ස්‍ය වගාවක් සඳහා ජල කළමනාකරණය තුල පවත්වා ගත යුතු භෞතික ගුණාංග මොනවා ද?
II. ඉහත ඔබ සඳහන් කල එක් ගුණාංගයක් ප්‍රශස්ත මට්ටමින් පවත්වා ගතයුතු ආකාරය පැහැදිලි කරන්න.
III. මිරිදිය මත්ස්‍යයන් වගාකල හැකි වගා ව්‍යුහ දෙකක් සඳහන් කොට ඉන් එකක් පැහැදිලි කරන්න.

3) අස්ථි පංජරයේ ස්වභාවය අනුව අස්ථික හා කාටිලේජීය ලෙස මත්ස්‍යයන් ප්‍රධාන කාණ්ඩ දෙකකට වර්ගීකරණය කල හැක.

I. අස්ථික මත්ස්‍යයෙකුගේ රූපසටහනක් ඇඳ බාහිරින් හඳුනාගත හැකි ලක්ෂණ හයක් නම් කරන්න.
II. a) මත්ස්‍යයන් තුල දක්නට ලැබෙන විවිධ සංවේදී අවයව තුනක් නම් කරන්න.
   b) මත්ස්‍යයන්ගේ පැවැත්මට එම සංවේදී අවයව උපකාර වන ආකාරය විස්තර කරන්න.
III. විවිධ පරිසර තත්ත්ව යටතේ තම පැවැත්ම තහවුරු කරගැනීම සඳහා මත්ස්‍යයන් දක්වන අනුවර්තන දෙකක් සඳහන් කරන්න.

4) ලොව හමුවන පරිසර පද්ධති අතර වඩාත් විශාල ජෛව නිෂ්පාදනයක් හා ජෛව විවිධත්වයක් සහිත පරිසර පද්ධතිය ලෙස කොරල්පර හැඳින්විය හැක.

I. ශ්‍රී ලංකාව තුල හමුවන ජාත්‍යන්තර ප්‍රසිද්ධියට පත් කොරල්පර හතරක් නම් කරන්න.
II. a) ලෝකයේ මුළු සාගර තලයෙන් කොපමන ප්‍රමාණයක් කොරල්පර වලින් වැසී පවතී ද?
   b) කොරල්පර ආශ්‍රිත පරිසර පද්ධතියෙන් ලැබෙන ප්‍රයෝජන තුනක් සඳහන් කරන්න.
III. කොරල්පර ආශ්‍රිතව වැඩෙන මත්ස්‍යය විශේෂ තුනක් සඳහන් කරන්න.

PAST PAPERS WIKI

Past Papers Wiki

5) වර්තමානයේ විසිතුරු මත්ස්‍ය කර්මාන්තය තුලින් දේශීය මෙන්ම විදේශියව ආර්ථික ප්‍රතිලාභ ඉපයිය හැකිය.

I. විසිතුරු මත්ස්‍ය අභිජනනය සඳහා මව් සතුන් තෝරාගැනීමේදී සැලකිලිමත් විය යුතු කරුණු තුනක් ලියන්න.
II. අභිජනනය සඳහා තෝරාගත් පරිණත ගැහැණු මත්ස්‍යයෙකු පරිණත පිරිමි මත්ස්‍යයෙකුගෙන් වෙන්කර හඳුනා ගත හැකි ලක්ෂණ දෙකක් සඳහන් කරන්න.
III. a) අභිජනනයේ දී යම් මත්ස්‍යයෙකු රෝගයක් සඳහා ග්‍රාහී වූ විට හඳුනා ගත හැකි ලක්ෂණ තුනක් සඳහන්කරන්න.
b) එම රෝගී තත්වයන් වලක්වා ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ග දෙකක් සඳහන් කරන්න.

6) ආහාරයට මෙන්ම විසිතුරු අලංකරණය සඳහා ශ්‍රී ලංකාව තුළ ජලජ ශාක වගාව සිදු කෙරේ.

I. a) මිරිදියෙහි වගා කල හැකි ජලජ ශාක දෙකක් නම් කරන්න.
b) කරදිය ජලජ ශාක ආශ්‍රිත නිෂ්පාදන දෙකක් නම් කරන්න.
II. දඬු කැබලි මගින් ප්‍රචාරණය කරන ජලජ පැලෑටි දෙකක් සඳහන් කරන්න.
III. a) විසිතුරු ජලජ පැළෑටි වලට හානි කරන පළිබෝධකයන් දෙදෙනෙක් නම් කරන්න.
b) ජලජ පැළෑටි වලට බහුලව වැලඳෙන රෝග දෙකක් සඳහන් කරන්න.

7) ස්වාභාවික උපද්‍රව හා මනාව ක්‍රියාකාරකම් හේතුවෙන්, ශ්‍රී ලංකාවේ ජලජ පරිසර පද්ධති තිරසාරව පවත්වා ගැනීම අභියෝගයක්ව පවතී.

I. ජලජ පරිසර පද්ධතිවල ප්‍රයෝජන කෙටියෙන් පහදන්න.
II. a) ශ්‍රී ලංකාවේ ජලජ පරිසර පද්ධතිවල තිරසර බව ආරක්ෂා කරගැනීම සඳහා කටයුතු කරන ආයතන දෙකක් නම් කරන්න.
b) ඉන් එක් ආයතනයක කාර්යභාරය විස්තර කරන්න.
III. ශ්‍රී ලංකාවේ ජලජ පරිසර පද්ධතිවල තිරසර බවට බලපාන තර්ජන දෙකක් ලියා දක්වන්න.

PAST PAPERS WIKI
WWW.PastPapers.WiKi
Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Papers Library